## Abstract

Planning is a continuous process. The aim of the study was to investigate the effectiveness of the School Education Quality Index (SEQI) in evaluating the achievement of a school by preparing and implementing School development plans such as the Annual Implementation Plan and the Five-Year Plan. This research study was done aiming 5 specific objectives. They are;

1. Identifying the strategies used by the selected schools when preparing their school-based plans.
2. Identifying the levels of implementation of both the Annual Implementation Plan and the Five-Year Plan by the selected schools.
3. Comparatively reviewing the marks obtained for the eight fields of evaluation separately with the final School Education Quality Index value obtained by each selected school.
4. Identifying the causes for the different values of School Educational Quality Index among the selected schools.
5. Making recommendations to improve the School development plans to reach the highest effectiveness of the school.

This dissertation includes the introduction to the research problem, problem statement, background of the problem and how studying of this problem might be important for schools and for other education officials both at national and provincial levels when conducting future research studies. The objectives of the research as well as the definitions related to the problem too are included.

An in-depth study was carried out based on the theoretical and Literature Review information. Definitions of school effectiveness, criteria for assessing the effectiveness and use of SEQI in measuring school effectiveness were investigated. Information on research studies carried out at national level and international level about school planning and effectiveness of school education was included.

The research design used was the Survey Research Design in Descriptive Research Approach. This study was conducted from August 2019 to December 2019; for a duration of 4 months. Here, schools belonging to the categories 1AB (national), 1AB (provincial) and 1C in Colombo South, Colombo North and Borella; three divisions of the Colombo Education Zone, were listed separately. 18 schools were selected out of the above lists in the proportional basis, depending on the number of schools in each list. Information was collected from the principals, deputy / assistant principals (Planning), deputy / assistant principals (Evaluation ) and the members of Planning and Evaluation committees in the above 18 schools; which added to a sample of 90 members in total. The data collected were presented in the form of percentages, graphs and tables. Furthermore, the data collected were presented, analyzed and interpreted according to the research methodology. Moreover, the data collected from all three different types of schools was analyzed to investigate how far the objectives have been achieved.

Conclusions were presented based on the interpreted data. When considering the strategies used to prepare the school development plan: preparing the plans within the specified time period, getting the approval from relevant authorities, fulfilling the fundamental requirements when preparing plans, preparing plans based on the guidelines given in 7/2013 circular of Ministry of Education and using required models when presenting the progress were at a high level in 1AB (national) schools, were at a medium level in 1AB (provincial) schools and were at a low level in 1C schools.

When considering plan preparation and implementation at school-level, it was observed that all three types of schools had adhered to the guidelines issued by the Ministry of Education. All schools had prepared the Annual Implementation Plan and the Five-Year Plan. Factors related to preparing organizational structures, constructing specific objectives, collecting data and information, diagnosing problems and resources, deciding policies, assessing the available resources, deciding priorities, setting objectives and targets, and different levels of implementation of Development Plans were identified in each school. In all the above situations 1 AB national schools displayed the highest level and 1 AB provincial schools contributed to a medium level whereas the 1 C schools displayed the lowest level.

When evaluating the levels of qualitative indicators obtained for the development plan, it was observed that 1AB national schools had higher values and except in one school, the values were lower in other 1AB provincial schools. Except in two schools, all the other 1C schools had lower values for fields of evaluation and for final SEQI.

It was identified that factors such as the number of students and teachers in a school, physical resources available at school, variety of sports, play grounds, laboratories and smart classrooms available in school etc affected the prevailing different SEQI values among schools. Thus, the SEQI of 1AB national schools was high due to availability of all the above factors and that of 1AB provincial schools was moderate. 1C schools displayed the lowest SEQI due to the minimum availability of facilities. Accordingly, it was identified that the effectiveness of the School Development Plans can be assessed using the SEQI; which may lead to identify the level of the school.

Finally, factors such as having a good understanding of the school, making all the stakeholders aware on preparing the School Development Plans, organizing workshops or training programmes, improving the supervision and monitoring towards planning, providing adequate human and physical resources, delegating responsibilities according to the hierarchy of the school, appointing a qualified Leader to the school, organizing more workshops and training programmes for the Principals, Deputy Principals and for the academic staff could be identified as the suggestions that can be used to enhance the effectiveness of the School development plans prepared by schools.

# සංක්ෂිප්තය

පාසල් මට්ටමේ සැලසුම් එනම් වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලසුම් හා පස් අවුරුදු සැලසුම් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ එමඟින් පාසල්වල ඇතිවන ඵලදායිතාවය, පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා වූ ඇගයීම් ක්‍රියාවලියේ ගුණාත්මක දර්ශක අගයන් ඇසුරින් ඇගයීමට ලක්කල හැකි ද යන්න පිළිබඳව විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම සඳහා සිදුකරන මෙම පර්යේෂණ අධ්‍යයනය සුවිශේෂී අරමුණු 05 ක් පදනම් කර සිදුකරන ලදි. ඒවා නම්,

1. පාසල් මට්ටමේ සැලසුම් සකස් කිරීමේ දී තෝරාගත් පාසල් යොදා ගන්නා උපාය මාර්ග හඳුනාගැනීම.
2. තෝරාගත් පාසල්වල ක්‍රියාත්මක කරන වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලසුම් හා පස් අවුරුදු සැලසුම් යන සැලසුම් දෙවර්ගය කුමන මට්ටමින් ක්‍රියාත්මකවේ ද? යන්න හඳුනාගැනීම.
3. පාසල්වල සැලසුම්වලට පාදක වන පාසල් ඇගයීමේ ගුණාත්මක සහතිකකරණ තේමා අටෙන් එක් එක් තේමාව සඳහා අත්කරගෙන ඇති අගයයන් හා පාසල අත්කරගෙන ඇති අවසාන ගුණාත්මක දර්ශකයේ මට්ටම සංසන්දනාත්මකව පරීක්ෂා කිරීම.
4. තෝරාගත් පාසල් අතර ගුණාත්මක දර්ශක අගයන්වල වෙනස්කම් ඇත්නම් ඒවා ඇතිවීමට බලපාන සාධක හඳුනාගැනීම.
5. පාසල් මට්ටමේ සැලසුම්වල ඵලදායිතාවය වැඩි දියුණු කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම.

මෙම පර්යේෂණ අධ්‍යයනයේ දී මූලිකව ගැටලුව පිළිබඳ හැඳින්වීම, ගැටලුව පිළිබඳ තොරතුරු, ගැටලුව අධ්‍යයනය කිරීමෙන් පාසල්වලට, අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනිකුත් කාර්යාලවලට හා අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන්ට ඉදිරි පර්යේෂණ අධ්‍යයනවලට ඇති වැදගත්කම, අධ්‍යයනයේ අරමුණු මෙන්ම ගැටලුවට අදාළ පද නිර්වචනය ද මෙහි ඇතුළත් කර තිබේ. ගැටලුව පිළිබඳ න්‍යායාත්මක හා ආනුභවික සාහිත්‍ය විමර්ශන තොරතුරු ඇසුරින් පර්යේෂණ අධ්‍යයනය පිළිබඳ ගැඹුරු පදනමක් ලබා ගන්නා ලදි. පාසලක ඵලදායිතාව පිළිබඳ අර්ථකථන මෙන්ම ඵලදායිතාව මිනුම් කරන නිර්ණායක ද පාසලක ඵලදායිතාව මිනුම් කිරීම සඳහා ගුණාත්මක දර්ශක අගයයන් භාවිතය පිළිබඳව තොරතුරු ද, විමර්ශනය කර ඉදිරිපත් කරන ලදි. එලෙසම දේශීය හා විදේශීය වශයෙන් සැලසුම්කරණය සම්බන්ධව හා පාසලක ඵලදායිතාව මිනුම් කිරීම සම්බන්ධව සිදුකරන ලද පර්යේෂණ අධ්‍යයනවල තොරතුරු ද ඉදිරිපත් කරන ලදි.

මෙම අධ්‍යයනයට අදාළ පර්යේෂණ පිරිසැලැස්ම ලෙස, විස්තරාත්මක ක්‍රමය යටතේ සමීක්ෂණ පිරිසැලසුම යොදා ගන්නා ලදි. මෙම පර්යේෂණ අධ්‍යයනය 2019 වර්ෂයේ සැප්තැම්බර් මස සිට 2019 වර්ෂයේ දෙසැම්බර් දක්වා මාස 04 ක කාලයක් තුළ

ක්‍රියාත්මක කරන ලදි. මෙහිදී කොළඹ අධ්‍යාපන කලාපයේ දකුණු කොළඹ, මැද කොළඹ හා බොරැල්ල යන කොට්ඨාශ තුනෙහි පාසල් අතරින් 1AB (ජාතික), 1AB (පළාත්) හා 1C යන පාසල් ලේඛන ගතකර එම ලේඛනයේ පාසල් අතරින් පවතින පාසල් සංඛ්‍යාවට අනුපාතිකව පාසල් 18 ක් තෝරා ගන්නා ලදි. මෙම පාසල් සහේතුක නියැදිකරණය යටතේ තෝරා ගන්නා ලද අතර එම කොට්ඨාශ තුනෙහි 1AB (ජාතික), 1AB (පළාත්) හා 1C යන පාසල් වෙන වෙනම ලේඛන ගත කර එම ලේඛනයෙන් දෙකේ ගුණාකාරයට අනුව පාසල් තෝරා ගන්නා ලදි. නියැදිය ලෙස එම පාසල් 18 හි විදුහල්පති, සැලසුම්භාර හා ඇගයීම්භාර නියෝජ්‍ය විදුහල්පති/ සහකාර විදුහල්පති, සැලසුම් කමිටු සාමාජික හා ඇගයීම් කමිටු සාමාජික යන අය අනූ (90) දෙනෙකුගෙන් තොරතුරු රැස් කරන ලදි. දත්ත රැස් කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා නියමාවලියක් හා ලිඛිත ප්‍රශ්නාවලි යොදා ගැනුණි. රැස් කරන ලද දත්ත ඉදිරිපත් කිරීමට ප්‍රතිශත, වගු, ප්‍රස්ථාර, භාවිතා කරන ලද අතර පර්යේෂණ ක්‍රමවේදය යටතේ රැස් කරන ලද දත්ත ඉදිරිපත් කිරීම, විශ්ලේෂණය හා අර්ථකථනය සිදුකරන ලදි. රැස් කරන ලද ගුණාත්මක දත්ත සංඛ්‍යාත්මකව විශ්ලේෂණය හා අර්ථකථනය සිදුකරන ලදි. තවදුරටත් එක් එක් අරමුණු අනුව පාසල් වර්ග තුනටම අදාළව රැස් කරන ලද දත්ත විශ්ලේෂණය කර අරමුණු කොතෙක් දුරට සාර්ථක වී තිබේ ද යන්න විමර්ශනය කරන ලදි.

අර්ථකථනය කරන ලද දත්ත අනුව ගන්නා ලද නිගමන ඉදිරිපත් කරන ලද අතර සැලසුම් සකස් කිරීම සඳහා භාවිතා කරන ලද උපාය මාර්ග සැලකුවිට නියමිත කාලයට සැලසුම් සකස් කිරීම, අනුමැතිය ලබා ගැනීම, සැලසුම් සම්පාදනය සඳහා වූ පදනම් අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ දී මෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ 7/2013 චක්‍රලේඛ උපදෙස් අනුව සැලසුම් සැකසීමේ හා ප්‍රගතිය වාර්තා කිරීමේ ආකෘති භාවිතා කිරීමත් 1AB ජාතික පාසල්වල ඉහළ මට්ටමින් ද, 1AB පළාත් පාසල් මධ්‍යස්ථ මට්ටමින් හා 1C පාසල්වල අඩු මට්ටමින් ද සිදුකර තිබුණි.

පාසල් මට්ටමේ සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ මට්ටම සලකා බැලීමේ දී සැලසුම් සම්පාදනය සඳහා උපදෙස් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ හා මාර්ගෝපදේශ අනුව පාසල් වර්ග තුනම සිදුකර ඇති අතර වාර්ෂික සැලසුම් හා පස් අවුරුදු සැලසුම් සම්පාදනය සියලුම පාසල් සිදුකර තිබුණි. මෙම සෑම අවස්ථාවකම 1AB ජාතික පාසල්වල මට්ටම ඉහළ ද, 1AB පළාත් පාසල් මධ්‍යස්ථ මට්ටමින් හා 1C පාසල්වල අඩු මට්ටමින් ද සිදුකර තිබුණි.

පාසල්වල සැලසුම්වලට පාදකවන ගුණාත්මක සහතිකකරණ අගයන් හා ගුණාත්මක දර්ශක අගයන්ගේ මට්ටම පරීක්ෂා කළවිට 1AB ජාතික පාසල්වල ඉහළ වූ අතර 1AB පළාත් පාසල් එකක හැර ඉතිරි පාසල් අඩු ය. 1C පාසල් අතරින් පාසල් දෙකක හැර ඉතිරි පාසල්වල ප්‍රමිති අට සඳහා මෙන්ම අවසන් ගුණාත්මක දර්ශක අගයන් වලින් ද අඩු අගයන් පවතින බවත් හඳුනාගත හැකිවිය.

පාසල්වල ගුණාත්මක දර්ශක අගයන් වෙනස්වීම කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීමේ දී, පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යා, ගුරු සංඛ්‍යා, භෞතික සම්පත්, පවතින ක්‍රීඩා, ක්‍රීඩා පිටි, විද්‍යාගාර, Smart පන්ති කාමර ආදිය බලපාන බව හඳුනාගත හැකිවිය. මෙම සාධක සියල්ල පවතින 1AB ජාතික පාසල්වල ගුණාත්මක දර්ශක අගය ඉහළවන අතර 1AB පළාත් පාසල් මධ්‍යස්ථ හා 1C පාසල්වල මෙම සාධක ඉතා අවම මට්ටමින් පවතින බැවින් එය ගුණාත්මක දර්ශක අගය අඩුවීම කෙරෙහි බලපාන බවත් හඳුනාගත හැකිවිය.

පාසල්වල සකස් කරනු ලබන සැලසුම්වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා යෝජනා ලෙස සැලසුම් සැකසීමේ දි, පාසල්වල යථා ස්වරූපය අවබෝධකර ගෙන සැලසුම් සැකසීම, සැලසුම් සැකසීම පිළිබඳ සියලු පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම, සැලසුම්කරණය පිළිබඳ අධීක්ෂණය නියාමනය වැඩි කිරීම, මානව භෞතික සම්පත් ප්‍රමාණවත් පරිදි ලබාදීම, වගකීම් නිසි පරිදි ධුරාවලියකට අනුව පැවරීම, පාසල්වලට ඉහළ මට්ටමේ සුදුසුකම් සහිත නායකත්වයක් ලබාදීම, විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පතිවරුන්ගේ හා කාර්ය මණ්ඩල පුහුණු වැඩි කිරීම ආදි යෝජනා මඟින් සාර්ථක කරගත හැකි බව හඳුනාගත හැකිවිය.